# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
**Co-operative Employees Commission (Southern Province)**
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2021.04.07 |

චක්‍රලේඛ අංක 03/2021

සියළුම සමුපකාරවල සභාපතිවරුන් වෙත,

**අනුමත නව තනතුරක වැටුප් ගෙවීම සම්බන්ධයෙනි.**

දකුණු පළාත් සමුපකාර සේවකයින්ගේ තනතුරු උසස් වීමකදී වැටුප් පියවර තබන ආකාරය පිළිබඳ සමුපකාර සමිති විවිධ අයුරින් ක්‍රියා කර ඇති බවට මෙම කොමිෂන් සභාවට වාර්තා වීම මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2. සේවකයින්ගේ තනතුරු උසස්වීමකදී වැටුප් පියවර තබන ආකාරය පහත පරිදි විය යුතු බව කාරුණිකව දන්වමි.

I. උසස්වීම් ලබන අවස්ථාවේදී සේවකයා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ වැටුප් පියවරවල් අතර ගැනේ නම්, ඔහු ආසන්න ඉහළ වැටුප් පියවරේ තබනු ලබන අතර, ඔහුට/ඇයට අතිරේක වැටුප් වර්ධකයක් ද ගෙවිය යුතුය.

II. උසස්වීම් ලබන අවස්ථාවේදී සේවකයා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට හෝ වැටුප් පියවරකට අනුරූප වේ නම්, ඔහු/ඇය ආසන්න ඉහළ වැටුප් පියවරේ තැබිය යුතුය.

III. උසස්වීම් ලබන අවස්ථාවේදී සේවකයා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට එක් වැටුප් වර්ධකයකින් (උසස් වූ තනතුරේ වැටුප් වර්ධක අගය) හෝ ඊට වැඩි වර්ධක ගණනකින් අඩුවන්නේ නම්, ඔහු/ඇය නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තැබිය යුතුය.

IV. උසස්වීම් ලබන අවස්ථාවේදී සේවකයා අවසාන වශයෙන් ලැබූ වැටුප, නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා අඩුවන්නේ එක් වැටුප් වර්ධකයක අගයට (උසස් වූ තනතුරේ වැටුප් වර්ධක අගය) අඩු ප්‍රමාණයකින් නම්, ඔහු/ඇය නව වැටුප් ප්‍රමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබා අතිරේක වැටුප් වර්ධකයක් ගෙවිය යුතුය.




ලේකම් / செயலாளர் / Secretary } 091-2232794 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

V. සේවකයාගේ ඉදිරි වැටුප් වර්ධක දිනය විය යුත්තේ උසස් වීම් ක්‍රියාත්මක වන දිනයයි.

මෙම චක්‍රලේඛය කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

2021.04.08

ජයන්ත ජී. ලියනගේ
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත - 1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන …….. සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - දැ.ගැ.ස.
3. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට